
# ගෙඹි පැංචෝ සහ වලස්හාමි



ඩබ්ලිව්.පී.ලිතුලි එහස්නා
කරුණාරත්න

# ගෙඹි පැංචෝ සහ වලස්හාමි

ඩබ්ලිව්.පී.ලිතුලි එහස්නා කරුණාරත්න

කතෘ

## කතෘගේ වෙනත් කෘති

1. සමනලයාව බේරාගත්ත මී මැස්සා
2. හොඳම යහළුවෝ

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

3 - A ශ්‍රේණිය

කෘතිය පළ කරන දිනය - **2025.02.08**

**ISBN 978-624-208-518-0**

# පිදුම

සුවහසක් එළි දල්වා

මාගේ දිවි ආලෝකමත් කරන්නට,

අභිමානයෙන් පෙරට යන්නට,

නුවණින් ලොව දකින්නට,

මංපෙත් විවර කර දුන්

ආදරණීය ගුරු මැණිවරුන්ටත් ,

ගුරු පියවරුන්ටත්,

දෙමව්පියන්ටත්,

පිරි නමමි සෙනෙහසින්

මාගේ මේ අප්‍රමාණ ව්‍යායාමය.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරුඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය, ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය -<br>
මහනුවර.

එකෝමත් එක කැලෑවක නියඟයක් හට ගත්තා.

එ නිසා ඒ කැලෑවේ සිටි ගෙඹි යහළුවෝ හතර දෙනෙක් වතුර හොයාගෙන කැලෑව මැදින් යන කොට, වලහෙක් මුණ ගැහුණා.

වලහා, ගෙඹි යහළුවන්ට කතා කලා.



"යහළුවනේ..."

"ඔයාලා හතරදෙනා කොහේද මේ යන්නේ." වලස්හාමි ඇහුවා.

"අපි මේ යන්නේ විලක් හොයාගෙන." ගෙඹි පැංචෙක් දුකින් කිව්වා.



"ආ ......... මම දන්නවා.
විලක් තියෙන තැනක්."

"ඔහොම තව ටිකක් ඉස්සරහට ගියාම ලොකු විලක් තියෙනවා." වලස්හාමි යන්න ඕනි දිශාව පෙන්නුවා.


"වලස්හාමිට ගොඩාක් ස්තුතියි." ගෙඹි පැංචෝ කිව්වා.

**"එහෙනම් යහළුවනේ මම යනවා.**

**ඔයාලා හොඳට විනෝද වෙන්න..." වලස්හාමි යන්න ගියා.**

**ගෙඹි පැටවු හතරදෙනා විල හොයාගෙන විල ගාවට ගියා.**

**විලේ තවත් ගෙබි රංචුවක් සෙල්ලම් කරමින් සිටියා.**




විලේ හිටිය ගෙඹි රංචුව අලුත් ගෙඹි යහළුවෝ හතරදෙනා දැකලා කලබල උනා.

"මොකද ඔයාලා මෙහෙට ආවේ......" විලේ හිටිය ගෙම්බෙක් ඇහුවා.

"අපි වතුර හොයාගෙන ආවේ."

"නියඟයක් ඇවිත් අපි හිටිය විලේ වතුර හිඳුනා ඒකයි ... අපි වතුර හොයාගෙන ආවේ."

"වලස්හාමි තමයි අපිට මේ විලට එන පාර කිව්වේ."ගෙඹි පැංචෙක් කිව්වා.




"යහළුවනේ අපි මේ විලට බහින්නද?"

තවත් ගෙඹි පැංචෙක් දුකින් ඇහුවා.

"කවුරුත් මේ විලට බහින්න එපා......."එතන විලේ හිටිය ලොකු ගෙම්බෙක් කිව්වා.

"ඇයි......? අපිට බහින්න එපා කියන්නේ." ගෙඹි පැංචෙක් ඇහුවා.

"මේ විලේ වතුර අයිති අපිට විතරයි.

පිට කැලෑවෙන් එන අයට වතුර දෙන්නේ නෑ....." විලේ හිටිය ගෙඹි නායකයා කිව්වා.



"අනේ......!"

"අපි ගොඩක් දුර ඉඳන් ආවේ.අපිට එහෙම කරන්න එපා......" ගෙඹි පැංචෝ හතරදෙනාම ආයාචනාත්මකව කිව්වා.

විලේ හිටිය ගෙම්බෝ, ගෙඹි පැංචෝ හතර දෙනාට විලට බහින්න දුන්නෙ නෑ.

ඔවුන් හතරදෙනා ගලක් උඩට වෙලා දුකෙන් බලාගෙන හිටියා.



ඒ ඉන්නකොට එක ගෙඹි පැංචෙක්ට ක්ලාන්තය හැදිලා බිම ඇද වැටුනා.

"අනේ .......! යහළුවනේ"

"මට නම් දැන් හොඳටම අමාරුයි" කියලා ගෙඹි පැංචා කිව්වා.

"අපි දැන් මොකද කරන්නේ?

මොවුන් අපිට වතුර දෙන්නේ නැහැනේ ."

"යහළුවනේ ......... යහළුවනේ ..........

අපේ මේ යහළුවෙක්ට හරිම අමාරුයි.

වතුර ටිකක් දෙන්න බැරිද?"

"එහෙම දෙන්න බෑ......" කියලා විලේ හිටිය ගෙම්බෙක් කිව්වා.

"කවුරුත් වතුරට බහින්න එපා ......

මේ විලට බහින්න පුළුවන්නේ අපේ අයට විතරයි." විලේ හිටිය ගෙඹි නායකයා කිව්වා.



විලේ හිටිය ගෙම්බෝ, ගෙඹි පැංචෝ හතර දෙනාට වතුරට බහින්න දුන්නේ නෑ.

යහළුවෝ හතරදෙනා දුකින් විල උඩට වෙලා ඉන්න විට වලස්හාමි වතුර හොයාගෙන විලට ආවා.

විලේ හිටිය ගෙම්බෝ වතුර යටට ගියා.




යහළුවනේ මොකද මෙතනට වෙලා කරන්නේ.

ඇයි විලට  බැහැලා සතුටුවෙන්නේ නැත්තේ....." කියලා වලස්හාමි ඇහුවා.

"අනේ වලස්හාමි අපිට මේ විලට බහින්න  දෙන්නේ නැනේ." එක් ගෙඹි පැංචෙක් කිව්වා.

"අපේ යහළුවෙක්ට ක්ලාන්තය හැදිලා හොදටම අමාරුයි." කියලා තවත් ගෙඹි පැංචෙක් කිව්වා.

වලස්හාමි, විලේ හිටිය ගෙඹි යහළුවන්ට කතා කලා.

"යහළුවනේ..... යහළුවනේ..... වලස් හාමි කතා කරන්නේ. එළියට එන්න යහළුවනේ ..."

"යහළුවනේ මේ ගෙඹි යහළුවන්ට වතුර දෙන්න. මේ යහළුවන් ගොඩක් දුර ඉදන් ආවේ."

"මම තමයි මේ විලට එන්න පාර පෙන්නුවේ."



"වලස්හාමි ඇයි කතා කලේ." කියමින් වලස්හාමිගේ කටහඬ ඇහිලා ගෙම්බෝ හැමෝම එළියට ආවා .

"ඒත් වලස්හාමි මේ විලේ වතුර අයිති අපේ කැලෑවේ අයට විතරයි.

වෙනත් අයට දෙන්න බෑ" කියලා එතන හිටිය වැඩිහිටි ගෙම්බෙක් කිව්වා.

"ගෙඹි යහළුවනේ ......"

"මේ කැලෑවේ තියෙන වතුර ඔයාලට විතරක් නෙවෙයි අපි හැමෝටම ප්‍රයෝජනයට ගන්න පුළුවන්."

"ඒ නිසා අපි මේ යහළුවන්ට උදවු කරමු."

"ඒත් අපි කැමති නෑ ............" කියලා විලේ හිටිය ගෙම්බෝ ශබ්ද නගා කෑ ගැසුවා.

වලස්හාමි මෙහෙම කිව්වා.

"යහළුවනේ... අපි එකිනෙකාට උදවු කර ගන්න ඕන. සැපේදි වගේම දුකේදීත්...."

මෙය ඇසූ විලේ නායක ගෙම්බා ගල උඩ සිටි ගෙඹි යහළුවන්ට කතා කලා.



" යහළුවනේ එන්න වතුරට බහින්න...."

"ඕන තරම් වතුර සෙල්ලම් කරන්න." කියලා විලේ හිටිය ගෙම්බන් කිව්වා.

ගෙඹි යහළුවන් හතර දෙනාට වතුරට බහින්න ඉඩ දුන්නා.

ගෙම්බෝ සියළු දෙනාම එක්ව සතුටින් සෙල්ලම් කලා.

"යහළුවනේ,ඔයාලා ඕන කාලයක් මේ විලට වෙලා ඉන්න අපි දැන් යහළුවන්"



එදායින් පසු  වතුර සොයාගෙන විලට ආව හැම සතෙක්ටම වතුර ගන්න ඉඩ දුන්නා.

එකිනෙකාට උදවු කර ගනිමින් හැමෝම සතුටින් ජීවත් උනා.

## පුංචි අපි හිතට ගන්න ඕන කරදරයක් උන අවස්ථාවලදී හැමෝටම උදවු උපකාර කරන්න.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම්

**ISBN 978-624-208-518-0**